## (2) දකුණු පළාත් සභාවේ 1989 අංක 3 දරන (පළාත් සභා සභාපති, නියෝජ්‍ය සභාපති) වැටුප් හා දීමනා ගෙවීමේ ප්‍රඥප්තිය.

දකුණු පළාතෙහි පළාත් සභාවේ සභාපතිවරයාට සහ නියෝජ්‍ය සභාපතිවරයාට වැටුප් හා දීමනා නියම කරනු ලැබීමට අදාළ ප්‍රඥප්තියකි.
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**1.** මෙම ප්‍රඥප්තිය 1989 අංක 3 දරන (පළාත් සභා සභාපති හා නියෝජ්‍ය සභාපති) වැටුප් හා දීමනා ගෙවීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

**2.** මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක දින සහ ඉන් පසුව,
(අ) පළාත් සභාවේ සභාපතිවරයාගේ මාසික වැටුප දීමනා තත් කාලයෙහි පළාත් සභාවේ අමාත්‍යවරයෙකුට ගෙවනු ලබන වැටුප් සහ අනෙකුත් දීමනා වලට සමානවද, දකුණු පළාත් සභාවේ සභාපතිට හා නියෝජ්‍ය සභාපතිට ගෙවනු ලබන වැටුප් හා දීමනා

(ආ) පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයාගේ මාසික වැටුප හා දීමනා තත් කාලයෙහි රාජ්‍ය අමාත්‍යවරයෙකුට ගෙවනු ලබන වැටුප් සහ අනෙකුත් දීමනා වලින් සියයක පනහකට සමානවද ගෙවිය යුත්තේය.

**3.** මෙම ප්‍රඥප්තිය යටතේ ගෙවනු ලබන සභාපතිවරයාගේ හා නියෝජ්‍ය සභාපතිවරයාගේ වැටුප් හා දීමනා පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේය. වැටුප් හා දීමනා පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේය